## ශාලාධිපති / සහකාර ශාලාධිපතිවරුන් සඳහා විශේෂ උපදෙස්

**සාමාන්‍ය තොරතුරු තාක්ෂණ (GIT) විභාගය - 2018 (තෙවන පෙරහුරු පරීක්ෂණය)**

**මාර්ගගත ක්‍රමය (Online) යටතේ පැවැත්වීම - 2019.03.11 දින සිට 2019.03.18 දින දක්වා**

**ඔබ වෙත සපයා ඇති කවර විවෘත කිරීමට පෙර පහත සඳහන් උපදෙස් අනුගමනය කරන්න.**

> ✶ **සැනෙලි මතකය, DVD තැටිය හෝ මාර්ගගත ආකාරය යන ක්‍රම තුනෙන් ඕනෑම ක්‍රමයකට විභාග අපේක්ෂකයින්ට විභාගය සඳහා ප්‍රවේශ වීමේ අවස්ථාව ලබා දී ඇත.**
>
> **තාක්ෂණික උපදෙස් හා ගැටළු සඳහා විමසීම් : 011-3661122/011-3671568/0711619807**
> **071-0918274/0775288014**

**1. සැනෙලි මතකය හා මුරපදය (PEN DRIVE & PASSWORD) කවරය**

- මෙම කවරයෙහි සැනෙලි මතක (PEN DRIVE) 01ක් පමණක් අඩංගු වේ.
- 2019.03.10 දින මෙම කවරය විවෘත කර සැනෙලි මතකය SERVER පරිගණකයට සම්බන්ධ කර නිවැරදිව ක්‍රියාත්මකවේද යන්න පරීක්ෂා කොට බලා නැවත ඔබට සපයා ඇති සැනෙලි මතක කවරයට බහා මුද්‍ර තබා සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙත බාර දෙන්න.
- සැනෙලි මතකය භාවිතයෙන් පරිගණකය පණ ගැන්වීමට (boot) විනාඩි පහකට වඩා ගත වේ නම්, විකල්ප ක්‍රියාමර්ගය ලෙස DVD තැටිය භාවිතා කරන්න. ඒ සඳහා (ඇමුණුම 01) සඳහන් පියවර භාවිතා කරන්න.
- පරීක්ෂාව සඳහා ඔබ භාවිතා කළ යුතු පරිශීලක නම්, මුරපද හා URL එම කවරය තුළම අඩංගුව ඇත.

  **සැ.යු. :**

  - පරීක්ෂණයට පෙර සියලු ම පරිගණයන්හි පද්ධති වේලාව (SYSTEM TIME) සම්මත වේලාවට අනුකූලව සකස් කිරීමට කටයුතු කරන්න.
  - සෑම විටම සැනෙලි මතකය USB 3.0 කෙවෙණියට සම්බන්ධ කරන්න.

**2. විභාග අපේක්ෂකයන්ගේ පරිශීලක නම/මුරපදය (USER NAME/PASSWORD) කවරය**

- මෙම පැකට්ටුව තුළ සියලු ම දින සඳහා පැමිණෙන විභාග අපේක්ෂකයින්ගේ පරිශීලක නම් හා මුරපද අඩංගු වේ.
- 2019.03.10 දින විවෘත කර පසු දින පරීක්ෂණය සඳහා පෙනී සිටීමට නියමිත විභාග අපේක්ෂකයින්ගේ පරිශීලක නම හා මුරපදය ප්‍රදර්ශනය කිරීමට සුදුසු වන පරිදි සකස් කර ගන්න. දිනපතා මෙම පරිශීලක නම් හා මුරපද අදාළ අපේක්ෂකයන්ට අයත් පරිගණකය ඉදිරියේ ප්‍රදර්ශනය කළ යුතු වේ.

**3. ප්‍රවේශ යතුර (QUIZ PASSWORD) කවරය**

- **සෑම වරුවක් සඳහා ම ප්‍රවේශ යතුර ( QUIZ PASSWORD ) අඩංගු කවරය බැගින් ඇති අතර** එම කවරය සෑම දිනකම සම්බන්ධීකරණ මධ්‍යස්ථානයෙන් ලබා ගත යුතුය.
- **සෑම සැසියක්ම ආරම්භ කිරීමට විනාඩි 05කට පෙර කවරය විවෘත කර විනාඩි දෙකකට පෙර ප්‍රවේශ යතුර අපේක්ෂකයන්ට ප්‍රදර්ශනය කළ යුතුයි.**

**4. විභාගයට පෙර දිනයේදී හා විභාගය පැවැත්වෙන දිනයේදී පහත උපදෙස් අනුගමනය කළ යුතු වේ.**

**විභාගයට පෙර දින**

01. ජාල ස්විචයට (Network Switch), UPS එකක් සම්බන්ධ කළ යුතුය.

02. සෑම පරිගණකයකම ආගන්තුක ගිණුමක් (Guest account) සෑදිය යුතුය.

03. සෑම පරිගණකයකටම,

   a. ප්‍රතිවෛරස මෘදුකාංගයක් ස්ථාපනය කළ යුතුය.

   b. ප්‍රතිවෛරස, Windows / Isuru Linux හා browser මෘදුකාංග update කළ යුතුය. (Isuru Linux Update කිරීමට අදාළ උපදෙස් සඳහා https://www.linkedin.com/pulse/security-update-apt-debian-ubuntu-danishka-navin සබැඳිය පරිශීලනය කරන්න.)

   c. Network Discovery on කළ යුතුය.

04. සෑම පරිගණකයකම Firefox (Latest Version) or Chrome (Latest Version) මෘදුකාංග ස්ථාපනය (Install) කළ යුතුය.

05. Download ෆෝල්ඩරය හිස් කළ යුතුය.

06. Spreadsheet, Presentation, database සහ word processing මෘදුකාංගවලට අදාළ Recent Documents මකා දැමිය යුතුය.

07. ආගන්තුක ගිණුම (Guest account) හැර අනෙකුත් ගිණුම්වල මුරපද වෙනස් කර නව මුරපදයන්හි ලැයිස්තුවක් සකසා ගත යුතුය.

08. Wi-Fi Network අක්‍රිය කළ යුතුය.

09. සෑම පරිගණකයක්ම පරිගණක ජාලය හරහා Server පරිගණකය සමඟින් රැහැන් මඟින් සම්බන්ධිත දැයි පරීක්ෂා කළ යුතුය.

10. ශබ්ද නිපදවන Multimedia අක්‍රිය කළ යුතුය.

11. "Screen Servers/ Power Servers/Notifications/Windows Updates" අක්‍රිය කළ යුතුය.

12. විභාගය සඳහා යොදා ගන්නා පරිගණක සියල්ලෙහිම (Keyboard, Mouse, Monitor, Network Cable, Power Cable හැර) අමතර උපාංග සවිකර තිබුණේ නම් ඒවා ඉවත් කළ යුතුය.

13. විද්‍යාගාරය තුළ "White board" එකක් තැබිය යුතුය.

14. Network File sharing අක්‍රිය කළ යුතුය.

15. Screen Sharing / Screen Recording මෘදුකාංග අස්ථාපනය (Uninstall) කළ යුතුය.

16. මේස පරිගණකයන්හි (Desktop Computers) "Bluetooth" පහසුකම ඇත්නම් එය අක්‍රිය කළ යුතුය.

17. Server PC හා Backup PC වෙනුවෙන් පරිගණක දෙකක් වෙන් කළ යුතුය.

18. Server PC හා Backup PC හැර සෑම අයදුම්කරුවන් විසි දෙනෙකුටම අතිරේක පරිගණක දෙක බැගින් වෙන් කළ යුතුය.

19. සෑම පරිගණකයකටම UPS එකක් හරහා විදුලිය ලබාගත යුතුය.

20. විභාග අයදුම්කරුවන් අතර පරතරය උපරිම වන පරිදි ආසන සකස් කළ යුතුය.

21. සෑම පරිගණකයකම Open Office හෝ Ms Office ස්ථාපනය (Install) කළ යුතුය.

22. Server PC හා Backup PC වෙනුවෙන් වෙන් කළ පරිගණක දෙකෙහිම,

   (a) USB මඟින් boot කළ හැකි වන පරිදි settings සකස් කළ යුතුය.

   (b) network card දෙකක් තිබේනම් network card 1ක් disable කළ යුතුය.

23. Router DHCP පහසුකම On කළ යුතුය.

## විභාගය පැවැත්වෙන දිනයේදී

01. විභාගය පැවැත්වීමට පැයකට පෙර සැනෙලි මතකය සර්වරයට සම්බන්ධ කළ යුතුය.

02. සැනෙලි මතකයෙන් සර්වරය boot කරගත යුතුය.

03. Server IP ලිපිනය සටහන් කරගත යුතුය.

**සෑම සැසියකටම පෙර,**

04. Download ෆෝල්ඩරය හිස් කළ යුතුය.

05. අයදුම්කරුවන්ගේ මේස මත ඔවුන්ගේ විභාග අංකය හා මුරපදය ප්‍රදශර්නය කළ යුතුය.

06. Spreadsheet, Presentation, Database සහ Word Processing මෘදුකාංගයට අදාළ Recent Documents මකා දැමිය යුතුය.

07. විභාගය පැවැත්වීමට විනාඩි 30 කට පෙර අයදුම්කරුවන් විභාග ශාලාවෙහි අසුන් ගැන්විය යුතුය.

08. විභාගයට අදාළ උපදෙස් අයදුම්කරුවන් වෙත ලබාදිය යුතුය.

    (i) නව ෆෝල්ඩරයක් (New folder) Desktop හි සාදා ගත යුතුය.

    (ii) එය තම Index No. නමින් Rename කරගත යුතුය.

    (iii) තම ක්‍රියාකාරකම් එම ෆෝල්ඩරය තුළ සුරැකිය යුතුය.

    (iv) තම මේසය මත ඇති User name හා password භාවිතයෙන් පද්ධතියට ප්‍රවේශ විය යුතුය.

    (v) විභාගය ආරම්භ කරන්න යැයි දැනුම් දුන්විට ප්‍රශ්න පත්‍රය මත click කළ යුතුය.

    (vi) රචනා ප්‍රශ්නයන්ට අදාළ පිළිතුරු ඒ ඒ ප්‍රශ්නය අවසානයේදීම උඩුගත කළ යුතුය.

    (vii) රචනා ප්‍රශ්නයන්ට අදාළ පිළිතුරු සැපයීමේදී Ms Office, Open Office භාවිතා කරන විට තම ක්‍රියාකාරකම් විනාඩි 02කට වරක් වත් සුරැකිය යුතුය.

    (viii) උඩුගත කරන ලද පිළිතුරක් මකා දමා නව පිළිතුරක් නැවතත් උඩුගත කළ හැකිය.

    (ix) විභාගය අවසන්ව විනාඩි 15 ක් ගතවන තෙක් ප්‍රශ්න පත්‍රය Submit කළ හැකිය.

    (x) එම විනාඩි 15 තුළ පිළිතුරු සැපයීම හෝ පිළිතුරු උඩුගත කිරීම කළ නොහැකිය.

09. අයදුම්කරුවන් තම User Name හා Password භාවිතයෙන් පද්ධතියට ප්‍රවේශ වුවාදැයි පරීක්ෂා කළ යුතුය.

10. විභාගය ආරම්භ කිරීමට විනාඩි 02 කට පෙර Enrollment යතුර (Quiz Password) අයදුම්කරුවන් හට White Boardහි ප්‍රදශර්නය කළ යුතුය.

11. විභාගය ආරම්භ කිරීමට නියමිත වේලාවේදී ප්‍රශ්න පත්‍රය මත ක්ලික් (Click) කරන ලෙස නිවේදනය කළ යුතුය.

12. විභාගය අවසන් කිරීමට විනාඩි 15කට පෙර, විභාග අයදුම්කරුවන් පිළිතුරු උඩුගත කර ඇති ප්‍රශ්න පිළිබඳ සාරාංශය Dash Board තුළින් පරීක්ෂා කර, අයදුම්කරුවන්ට අවශ්‍ය උපදෙස් ලබාදිය යුතුය.

13. විභාගයට අදාළ කාලය නිම වූ පසු ප්‍රශ්න පත්‍රය Submit කර නොමැති අයදුම්කරුවන්ට Submit කිරීමට උපදෙස් ලබාදිය යුතුය.

14. පළමු සැසිය නිම වී දෙවන සැසියද නිමවන තෙක්ම සැනෙලි මතකය සවර්රය හා සම්බන්ධව තැබිය යුතුය.

- ඔබ වෙත එවා ඇති ලකුණු ලැයිස්තුවල මෙවර විභාග අංක මුද්‍රණය කර ඇත. නොපැමිණි අපේක්ෂකයින් උපදෙස් අනුව නොපැමිණීම ලකුණු කර ආරක්ෂිතව තබා ගෙන අවසාන දිනයේදී සියලු ලකුණු ලැයිස්තු අදාළ කවරයට බහා මුද්‍රා තබා දිනයට අදාළව සම්බන්ධීකරණ මධ්‍යස්ථානයට භාර දෙන්න.
- පැමිණීමේ ලේඛනයේ ඇතුළත් අයදුම්කරුවන්ගේ නියාමන (පෙරහුරු) අවසන් වී විනාඩි 15ක් ගතවූ පසු සැනෙලි මතකය සර්වරයෙන් ඉවත් කර අදාළ දින කවරයේ බහා මුද්‍රා තබන්න. රහස්‍ය ලේඛන සහ ඉතිරි ලිපිද්‍රව්‍ය දිනපතා සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙත භාර දී මධ්‍යස්ථානයේ කටයුතු අවසන් කරන්න.

එච්.එම්. සරත් චන්ද්‍රසිරි
විභාග කොමසාරිස්
(පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල)

අත්.කළේ: බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

H:\U . A\6.20\kawa¾ ope uÈse.docx

සැනෙලි මතකය (Pen Drive) භාවිතයෙන් පරිගණකය පණගැන්වීමට (boot) විනාඩි පහකට වඩා ගතවේ නම්, විකල්ප ක්‍රියාමාර්ගය ලෙස DVD තැටිය භාවිතා කරන්න. ඒ සඳහා පහත පියවර අනුගමනය කරන්න.

(i) සැනෙලි මතකය සර්වරයෙන් ඉවත් කර ගන්න. (නැවත විභාගය පුරාවටම සැනෙලි මතකය අවශ්‍ය නොවේ.)

(ii) සර්වර් පරිගණකය restart කරන්න.

(iii) සර්වර් පරිගණකයේ
My Computer (Right Click) ⟶ Computer Management ⟶ Disk Management
Select C disk or D disk (Right Click) ⟶ Shrink Volume ⟶ Enter the amount of space to shrink in MB **100 000** ⟶ Shrink

(iv) DVD තැටිය ඇතුළත් කර නැවත පරිගණකය පණ ගන්වන්න. (boot)

(v) Linux අතුරු මුහුණතෙහි (Interface) ඇති Install to hard drive මත click කර මෘදුකාංගය පරිගණකයෙහි ස්ථාපනය (Install) කර ගන්න. (ස්ථාපනයට අදාළ වැඩිදුර උපදෙස් සඳහා විභාග දෙපාර්තමේන්තුව මගින් ලබා දුන්, GIT 2018. Examination pilot 2.0., Installation User Guide, Offline Edition හෝ https://www.youtube.com/watch? V = hsrGUsw_oSk පරිශීලනය කරන්න.)

(vi) සර්වර් පරිගණකය නැවත පණ ගන්වන්න. (Restart)

(vii) DVD තැටිය ඉවත් කර ගන්න.

(viii) මෘදුකාංගය ස්ථාපනය කිරීමේදී ලබාදුන් username හා password භාවිතා කර පද්ධතියට ප්‍රවේශ වන්න.

(ix) server-setup ගොනුව execute කිරීම සඳහා Linux Terminal භාවිතා කරන්න.
sudo /usr/bin/server-setup

(x) මෘදුකාංගය ස්ථාපනය කිරීමේදී ලබාදුන් මුරපදය Root password ලෙස ඇතුළත් කරන්න.

(xi) ඔබගේ මධ්‍යස්ථාන අංකය ඇතුළත් කරන්න.

(xii) සර්වර් පරිගණකය නැවත පණ ගන්වන්න. (Restart)

(xiii) මෘදුකාංගය නිවැරදිව ක්‍රියාත්මක වේද යන්න පරීක්ෂා කොට බලා DVD පටය, සැනෙලි මතක කවරයට බහා මුද්‍රා තබන්න.

- ඔබගේ සර්වරයෙහි I.P. ලිපිනය 192.168.1.200 වේ.
  ඒ අනුව Client පරිගණකයන්හි host file සංස්කරණය (edit) කර ගන්න.
- නැතහොත් ඔබ මේ වනවිට host file හි ලබා දී ඇති I.P. ලිපිනය සර්වර් පරිගණකයෙහි I.P. ලිපිනය ලෙස Manual ආකාරයට සකස් කර ගන්න.

**ඔබ පරිගණක මධ්‍යස්ථානයෙහි අන්තර්ජාල පහසුකම් ප්‍රමාණවත් පරිදි වේ නම්, https://www.onlineexams.gov.lk යන අපගේ වෙබ් අඩවියට පිවිස අයදුම්කරුවන්ගේ username හා password භාවිතයෙන් විභාගයට මුහුණ දිය හැක.**